**සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් - 2023 ජූලි 31 දිනෙන් අවසන් වූ මාස හත සඳහා**

**------------------------------------------------------------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් ("සමාගම") සහ සමාගමේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ එහි පරිපාලිතයන්හි ("සමූහය") 2023 ජූලි 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් මාස හත සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් මාස හත සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 ජූලි 31 දිනෙන් අවසන් වූ මාස හත සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 ජූලි 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් මාස හත සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණු අවධාරණය කිරීම

මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 11 වෙත ඔබගේ අවධානය යොමු කරවන අතර එහි සඳහන් පරිදි රජය සතු ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා නව පරිපාලිත සමාගමක් ස්ථාපිත කර තිබීම හේතුවෙන් සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් සහ එහි අනුබද්ධ සෙලෙන්දිවා ලෙෂර් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ් ස්වේච්ඡාවෙන් විසුරුවා හැරීම සඳහා මුදල, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව විභාග වෙමින් පවතින නඩු කටයුතු සැලකිල්ලට ගනිමින් ස්වේච්ඡාවෙන් අවසන් කිරීම සඳහා නීතිපතිගේ කැමැත්ත විමසා ඇති අතර 2007 අංක 07 දරන සමාගම් පනතට අනුව කැබිනට් අනුමැතිය ලබාගෙන ස්වේච්ඡාවෙන් විසුරුවා හැරීමට කටයුතු කරන ලෙස නීතිපතිවරයා දැනුම් දී ඇත. ස්වේච්ඡාවෙන් විසුරුවා හැරීම සඳහා කැබිනට් අනුමැතිය 2023 ජූලි 5 දින ලබා දෙන ලදී. මේ අතර, සමාගම ස්වේච්ඡාවෙන් අවසන් කිරීමේ ක්‍රියාවලිය ඉදිරියට ගෙන යන බවට අධිකරණයට කරන ලද නියෝජනයෙන් පසු මූලික අයිතිවාසිකම් අයදුම්පත 2023 ඔක්තෝම්බර් 4 වැනි දින අධිකරණය විසින් නිෂ්ප්‍රභ කර ඇත.

තවද මූල්‍ය ප්‍රකාශනයේ අංක 4.1 (ඇ) සටහනට අනුව අධ්‍යක්ෂවරුන් විසින් සමාගමට පවතින හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති බවත් සමාගමේ මූල්‍ය ප්‍රාග්ධන පාඩුව බරපතළ තත්ත්වයකට පත්ව ඇති බවත් අනාවරණය වී ඇත. සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් සියයට 50 ට වඩා අඩු ශුද්ධ වත්කම් පිළිබිඹු වන හෙයින් සහ අධ්‍යක්ෂ මණ්ඩලය ස්වේච්ඡාවෙන් අවසන් කිරීමට තීරණය කර ඇත. එබැවින් සමාගමේ අඛණ්ඩ පැවැත්මක් නොමැත.

මේ කරුණ නිසා මගේ මතය තත්ත්වා ගණනය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත මාස හතෙහි මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,885,002 ක පාඩුවක් පෙන්නුම් කළ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පාඩුව රු. 7,036,430 ක් විය. මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වීමට ප්‍රධානතම හේතුව පරිපාලන වියදම් අඩුවීම විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අ) සමාගම 2021 දී සංස්ථාපිත කරන ලද නමුත් 2021 දී පුරවැසියෙකු විසින් සෙලෙන්දිවා ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්, සෙලන්දිවා ලෙෂර් ඉන්වෙස්ට්මන්ට් ලිමිටඩ් යන සමාගම් වලට එරෙහිව සිදුකර තිබූ මූලික අයිතිවාසිකම් පෙත්සමක් හේතුවෙන් 2023 ජූලි 31 අවසානය දක්වා කිසිදු ව්‍යාපාරික කටයුත්තක් ආරම්භ කර නොතිබුණි. , කෙසේ වෙතත් 2023 ජූලි 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. 19,802,426 ක සමුච්චිත පාඩුවක් දක්වා තිබුණි. | කෙසේ වෙතත් මූලික අයිතිවාසිකම් ඉල්ලීමක් ගොනුකිරීම හේතුවෙන් මෙය සාක්ෂාත් කර ගැනීමට නොහැකි විය. සමාගමට එරෙහිව පනවා තිබූ අතුරු තහනම් නියෝගය ඉවත දමා ඇති අතර කොටස් පැවරීමට මග සලසන සමාගමේ ලේකම්වරයාට එරෙහි අතුරු තහනම් නියෝග ඉවත් කිරීමට හෝටල් සංවර්ධකයන් කටයුතු කර ඇත. | සමාගමේ පාඩු අවම කරගැනීමට උපරිම උත්සහයක් ගතයුතුය. |
| ආ) සමාගම විසින් මූල්‍ය ප්‍රකාශනවල ඇවර කිරීමේ වියදම් සඳහා කිසිදු ප්‍රතිපාදනයක් සපයා නොතිබූ අතර විගණිත දිනය වන 2023 දෙසැම්බර් 19 වැනි දින වන විටත් ඇවරකරුවෙකු පත් කර නොතිබුණි. | සමාගම විසින් ඇවර කිරීමේ කටයුතු කරමින් පවතී. | සමාගම විසින් ඇවරකරුවෙකු පත්කිරීමට කටයුතු සිදුකළ යුතුය. |